1 වෙනි පිටුවෙන්

**මෙන්න නියම නොනවතින රැල්ල**

මොවුන් මොන තරම් කුහකයෝද?

## ඉන්දියාව අවසානයේ ස්ථිර පියවරක් ගනී

ගතවූ මාස කීපයේම ඉන්දියාව ඉදිරි කාලයේදී ඇතිවන මැතිවරණ වලදී කොන්ග්‍රස් පක්ෂයට ලැබිය හැකි සහාය කල්පනාවට ගනිමින් තමිල්නාඩුවේ නියෝගය පිට ශ්‍රීලංකාවේ පවතින තත්වය ගැන කුමන පියවරක් ගතයුතුදැයි සිතමින් පසුවූයේ දැඩි අපහසුතාවකිනි. ශ්‍රීලංකාවේ දෙමළ ජනාව මහා ජන සංහාරයකට මුහුණදී සිටින බවට බොරු චිත්‍රයක් මවා පාමින් කරුණා නිධි තමිල් නාඩුවේ ජනතාවට ලොකු නාටකයක් රඟපෑවේය. ඉන්දීය මධ්‍යම ආණ්ඩුවද ලංකාවේ තත්වය ගැන ඔවුන් සැළකිලිමත්වන බව පෙන්නුම් කළේ එසේ නොකිරීමෙන් පවතින සභාග රජයට තමිල්නාඩුවේ සහාය නොලැබී යාහකියි යන බය ද සිතැතිවය.

ශ්‍රීලංකාව හා ඉන්දියාව අතර දූත සාකච්ඡා ඇතිවුණේ එහි ප්‍රතිඵලයක් ලෙසිනි. ශ්‍රීලංකා රජය සැබෑ තත්වය තේරුම් කර දුන් පසු ඉන්දියානු රජය ස්ථිර මතයකට එළඹියේය. ඒ අනුව අගමැති මන්මෝහන් සිං ප්‍රකාශ කළේ ශ්‍රීලංකාව කොටි ත්‍රස්තවාදීන් කෙරෙහි ගෙන ඇති පියවර ශ්‍රීලංකාවේ අයිතිය බවත්, ඊට එරෙහිව ඉන්දියාව කිසිසේත් කටයුතු නොකරන බවත්ය. එසේම ඉන්දියාව ලංකාවේ දෙමළ ප්‍රශ්නයට අවසානයේ දේශපාලන විසඳුමකට පැමිණෙන්නේ නම් යහපත්යයි සිතන බවද කියා ඇත. මෙහිදී ඉන්දියාව පැහැදිලිව සහ නිවැරදිවම කොටි ත්‍රස්ත වාදීන් සහ සාමාන්‍ය දෙමළ ජනයා කොටස් දෙකක් ලෙස තේරුම්ගැනීම වැදගත්ය. අප ශ්‍රීලංකා රජය තේරුම් ගෙන ඇත්තේ ද එලෙසිනි.

## විදේශගත දෙමළ ප්‍රජාව

බලාපොරොත්තු වූ පරිදි නොයෙක් විදේශ රටවලට පැන සිටින කොටි සහ කොටි හිතවාදී දෙමළ ජනයා දැන් පරාජයට පත්වෙමින් දින දින ඇද වැටෙන කොටි සංවිධානයට ජීවන හුස්ම පිඹ යළිත් උන් නැගිටුවාගන්නා පිණිස සුපුරුදු උප්පර වැට්ටි දියත්කර ඇත. පළමුවෙන්ම ඔවුන් ආරම්භ කළේ කිලිනොච්චි මුලතිව් පෙදෙස්වල හිරවී කොටුවී සිටින සාමාන්‍ය දෙමළ සිවිල් වැසියන් රජයේ ප්‍රහාර වලින් මිය යන බව කියමින් ඒවා නවත්වන ලෙස විදේශ රජයයන්ට බලකරන උද්ඝෝෂණ හා කෑගැසීම් දියත් කිරීමයි. උතුරේ එසේ සිරවී සිටින දෙමළ වැසියන් බලයෙන් රඳවාගෙන රජයේ ප්‍රහාරවලින් බේරීම පිණිස එම වැසියන් මිනිස් පලිහක් ලෙස යොදාගෙන ඇත්තේ කොටි ත්‍රස්තවාදීන් විසින් බව දැන් මුළුමහත් ලෝකයාම හා බටහිර ජනමාධ්‍යයද හොඳින් තේරුම් ගෙන ඇත. ශ්‍රීලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතා උතුරේ සිවිල් ජනයාට කිසිදු පීඩාවක් නොවීමට තම රජය දැඩි ලෙස වගබලා ගන්නා බවට එක්සත් ජාතීන්ගේ ලේකම් බැන් කි මූන්ට ප්‍රතිඥාවක්ද දී ඇත.

බටහිර රටවල සිටින සංවිධිත කොටි හිතවාදී දෙමළ ප්‍රජාව ඉතා කපටි අන්දමින් කැනඩාවේ සහ බ්‍රිතාන්‍යයේ දේශපාලකයින් පසුපස ගොස් ලංකාවේ පවතින තත්වය පාර්ලිමේන්තු සාකච්ඡා අතරට ගෙන ශ්‍රීලංකා රජයට දැන් කරගෙන යන යුද්ධය වහා නවත්වන්නටත්, සටන් විරාමයකට එන ලෙසටත් බලකරන්නට යයි උද්ඝෝෂණය ගෙනයන්නට පටන් ගෙන ඇත. එහෙත් මෙම ක්‍රියාවෙහි යටි අදහස අන් කිසිවක් නොව ප්‍රභාකරන් ඇතුළු කොටි නායකයින් මුදවාගෙන කොහේට හෝ පන්නාගෙන යෑමට බව දැන් බටහිර මාධ්‍යකරුවන් පවා තේරුම් ගෙන සිටිති. එංගලන්ත පාර්ලිමේන්තුවේ මෙතෙක් කොටින් වෙනුවෙන් කෑගැසූ කීත් වාස්, සයිමන් හියුස් හා ජෙරමි කෝබින් වැනි දේශපාලනිකව බංකොලොත් මන්ත්‍රී වරුන් යළිත් කොටි වෙනුවෙන් සුපුරුදු වීණා ගායනාවට ඉදිරිපත්ව ඇත. මෙය ඔවුන් උතුරේ සිවිල් ජනයා කෙරෙහි උපන් සැබෑ අවංක මානව භක්තියෙන් කෙරෙන්නක් නොව ලබන වසරේ එන එංගලන්ත මැතිවරණයේදි ඔවුන් ලබන්නට නිසැක පරාජයෙන් බේරෙන අවශ්‍යතා සපුරාගනු සඳහා ය.



## එදා වයන පදට පාද තැබූ සොල්හයිම්

### එදා කොටින්ගේ තද මිතුරා වූ සොල්හයිම්ට අද කොටි සළකන්නේ ද්‍රෝහියෙකු ලෙසටය

## Tamil Tigers now call Norway's Eric Solheim, a traitor

The aid Sri Lankan group comprising of the U.S., E.U., Norway and Japan has urged the LTTE to lay down arms and to accept amnesty offer made by the government and to discuss the terms and conditions for a ceasefire. They also urge the LTTE to become a political party. This LTTE has flatly refused and the LTTE activists have started accusing Eric Solheim, their Norwegian friend of betraying them! We all know how Solhiem took a personal interest and supplied Tigers with modern equipments. Today he is seen as a traitor by the very people he supported. Oh ! What a world !

## ජාත්‍යන්තර සංවිධාන ගත් සැලකිය යුතු පියවර

ඇමරිකාව, යුරෝපා සංගමය, නෝර්වේ සහ ජපානය ඇතුළත් ශ්‍රීලංකාවට ආධාර සපයන්නට ඉදිරිපත්වූ සම සභාපතිවරුන්ගේ කණ්ඩායම ශ්‍රීලංකා වේ උතුරේ සිවිල් වැසියන්ට වන හානිය වළක්වාගනු පිණිස කොටි සංවිධානය වහාම ආයුධ බිම තබා යටත්වී ශ්‍රීලංකා රජයෙන් පිළිගන්වන සමාව ලබාගන්නා ලෙස ඉල්ලා සිටියත්, කොටි එය තරයේ ම ප්‍රතික්ෂේප කළ අතර, ඔවුන් තම නෝර්වේ මිතුරා වන එරික් සොල්හයිම් මේ මොහොතේ උදව්වට නොපැමිණීම ගැන සොල්හයිම් ද්‍රෝහියායයි කියමින් ඔහුට බනින්නට පටන්ගෙන ඇත.

මේ සියල්ලෙන් පෙන්නුම් කරන්නේ එල්ටීටීඊය යනු කිසි අණක් ගුණක් නැති, කොළෙහිගුණ නොදත්, මානව ගුණයෙන් අන්තිමටම හීන, මිනීමැරීමට ම උපන් තිරිසනුන් රැලක් බවයි.

අනෙක් අතට ශ්‍රීලංකා රජය හා එහි සන්නද්ධ හමුදාවන් මෙතෙක් ක්‍රියාකර ඇත්තේ හා දැනට ක්‍රියාකරන්නේත් තම දේශයේත්, එහි වෙසෙන සියළු ජනතාවගේත් සුබසිද්ධිය සඳහා ඉතා මානුෂිකව බව බව පැහැදිලිව පෙනෙන්නට තිබේ. රජය කොටුවී සිටින ජනතාවට කොටි ග්‍රහණයෙන් පැන එන්නට ආයාචනා කරමින්, එසේ පැමිණෙන අයට ආරක්ෂාව හා සියළු පහසුකම් සපයමින් සිටිති.

## අපේ ස්ථාවරය කුමක් විය යුතුද ?

අපේ ජනාතාවද, සන්නද්ධ හමුදාවන්, පොලීසිය සහ සිවිල් ආරක්ෂක හමුදාවන් ද සමස්ථයක් ලෙස මෙතුවක් ක්‍රියාකර ඇත්තේ කුමන ලෝක පීඩනය ආවත් කළබල නොවී, ඉතා පරෙස්සමෙන් ද, උපායශීලීවද, එසේම දුරදක්නා නුවණින් ද යුතුව රටේත් එහි නිවැසි සැමගේත් ශුභ සිද්ධිය පිණිසය. එය ප්‍රශංසා කටයුතුය.

අප මෙහිදී ශ්‍රීලංකා රජයෙන් උදක් ඉල්ලා සිටින්නේ බටහිර බලවේග හා කොටි හිතවාදීන් දේශීය හා ජාත්‍යන්තර වශයෙන් ගෙන එන කිසිදු පීඩනයකට, තර්ජනයකට, බාධාවකට බිඳකුදු යටත් නොවී, ඒවා නෑසූ කන් ඇතිව, අරමුණු කරගත් කාර්‍යවන අපේ දේශය ත්‍රස්ත වාදයෙන් මුදාගන්මට ගෙනඇති අභීත පියවර එය අවසානයක් දක්නා තුරු නොනවත්වාම, එක හුස්මට ඉදිරියටම ගෙන යන ලෙසයි. ඒ සඳහා මෙයට වඩා වෙනත් සුදුසු කාලයක් නොවේ. කාලෝ අයං තෙ.(මේ ඊට කාලයයි) ජය වේවා!





## ශ්‍රීලංකාවේ 61 වන නිදහස් දිනය සමරති

## Sri Lanka celebrates its 61st Independence Day

The grandeur of the **Galle Face Green** overlooking the azure sky blended with the solemn sea on **4th February 2009** to witness a nation celebrating its **61** years of independence with colourful motorcades and troops representing all sections of the Sri Lankan military saluting the heroes who laid down their lives to achieve freedom and unity for the motherland. **President Mahinda Rajapaksa** hoisted the national flag in the presence of the Prime Minister, ministers, the Commanders-in-Chief of the three armed forces and the IGP, MPs and diplomats to symbolise the unity and territorial integrity of a nation recovering from the scourge of terrorism. The SLAF helicopters ruled the sky while the navy craft displayed their military prowess at sea.

**කො**ළඹ සුප්‍රකට ගාලු මුවදොර පිටියේ කවදත් දක්නට ලැබෙන මහේශාඛ්‍ය ගතියේ අඩුවක් එදා ද නොවීය. ඒ වෙනුවට එය තවත් තේජසින් බබලන දිනයක් වූ බව පෙනිණ. නීලාකාශය හා නිල් සමුදුර පැහැයෙන් බබලමින් සැරසුණේ **61** වන අභිමානවත් ශ්‍රීලංකා ජාතික නිදහස් දිනය සමරනු දැක ගැන්මේ අභිලාෂයෙනි. අගමැතිතුමා, මැති ඇමතිවරු, ශ්‍රීලංකා ත්‍රිවිධ සේනාංකයන්හි නායක සෙන්පතිවරු, ශ්‍රීලංකා පොලිස්පති, තානාපතිවරු සහ විවිධ සම්භාවනීය අමුත්තන්ද ආදී මේ සියළු දෙන අබියස ශ්‍රීලංකා ජනාධිපතිවරගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජාතික සිංහ ධජය ඔසවා සනිටුහන් කළේ ශ්‍රීලංකා දේශයේ ඒකීය භාවය හා සෛවරීත්වය ආරක්ෂාකරන බවට පැහැදිලිකරන ප්‍රතිඥාවයි.

වර්ණවත් නිල ඇඳුමෙන් සැරසී ආචාර පෙළපාලියේ ගිය විවිධ හමුදා සේනාංකයන්හි පිරිමි හා කාන්තා භට පිරිස්ද, ඉහළ ආකාශයේ විදහා දැක්වූ ගුවන් යානා පෙළහරද, මුහුදේ සිට සිය අභිමානය දැක්වූ ශ්‍රීලංකා නාවික හමුදා යාත්‍රාවන්ද ආදී මේ සියල්ල එදින වෙහෙසුණේ ශ්‍රීලංකා දේශයට නිදහස දිනාගන්නට ජීවිත පරිත්‍යාග කළ හැමට ගෞරව දක්වනු පිණිස ය.

*Photographs* - **Chatura S. Kodikara - Rivira Media -** ***Sri Lanka***

## ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ ශ්‍රීලංකා ජාතික දිනය සැමරේ

ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ ශ්‍රීලාංකික සිසුන් විසින් ශ්‍රීලංකාවේ 61 වන නිදහස සැමරීමේ උත්සවයක් එම විශ්වවිද්‍යාලයේ සභා ගර්භයේදී පවත්වන ලදී. බ්‍රිතාන්‍යයේ ශ්‍රීලංකා මහකොමසාරිස්වර විනිසුරු නිහාල් ජයසිංහ මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් පැවති මෙයට මාලදිවයින, පකිස්ථානය, නේපාලය, පලස්තීනය, ඉන්දුනීසියාව හා ඉන්දියාව යන රටවල් නියෝජනය කරමින් ඒවායේ තානාපතිවරු හා මහකොමසාරිස්වරුද, ඔක්ස්පර්ඩ් නගරාධිපතිනියද, ඔකස්පර්ඩ් යුනිවර්ෂල් කොලීජියේ අධිපති ශ්‍රීමත් අයිවෝ ක්‍රෝව් මහතාද, යුරෝපා පාර්ලිමේන්තු මන්ත්‍රී නිරංජන් දේවාදිත්‍ය මහතාද සහභාගිවූහ.

සර්ව ආගමික වැඩසටහන්ද, ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ තොරතුරු රැගත් විඩියෝ පට දර්ශනයක් ද විය. ඔක්ස්පර්ඩ් විශ්වවිද්‍යාලයේ උගන්නා ඉන්දියාව, පකිස්ථානය, චීනය වැනි රටවල ශිෂ්‍යයින්ද මෙයට සහභාගීව සිටීම විශේෂයකි

මෙම උත්සවය පැවති ශාලාවට පිවිසෙන දොරටුව අසල කොටි ත්‍රස්තවාදීන්ට සහාය දක්වන බැනරයක් ගත් යුරෝපීය ජාතික තරුණයින් දෙදෙනෙකු පත්‍රිකා වගයක් බෙදමින් සිටි අතර ටික වේලාවකින් ඔවුන් ඉවත්ව ගොස් තිබුණි.

යුද්ධවල යෙදෙමින් ජන සංහාර මුලින්ම සිදුකරන ලද්දේ ආසියාතිකයින් නොව යුරෝපීය රටවල් බව යුරෝපීය පාර්ලිමේන්තු මන්ත්‍රී දේවාදිත්‍ය මහතා සිය කතාවේදී අවධාරණය කළවිට එම අදහසට රැස්වූ වැඩිදෙනාගේ අවධානය යොමුවූ බව පෙනුණි.

♦ **මේජර් වී. බී. කරුණාරත්න**
**Oxford UK**